# මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA



සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk


| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2024.12.31 |


## කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2024 දෙසැම්බර් මාසයේ දී ද ඍණ අගයක් වාර්තා කළේය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද කෙටි කාලීන උද්ධමන පුරෝකථන හා අනුකූලව, අඛණ්ඩව සිව්වන මාසයටත් ඍණ අගයක පවතිමින් 2024 නොවැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 2.1ක අවධමනයට සාපේක්ෂව 2024 දෙසැම්බර් මාසයේ දී සියයට 1.7ක අවධමනයක් වාර්තා කළේය.

| උද්ධමනය කො.පා.මි.ද., (2021=100) | 2024 නොවැම්බර් | 2024 දෙසැම්බර් |
|---|---|---|
| දර්ශක අගය | 189.4 | 191.7 |
| මාසික වෙනස (%) | -0.25 | 1.19 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | -2.1 | -1.7 |

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, ආහාර නොවන කාණ්ඩයෙහි අවධමනය, 2024 නොවැම්බර් මාසයේ වාර්තා වූ සියයට 3.3හි සිට 2024 දෙසැම්බර් මාසයේ දී සියයට 3.0ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය. මේ අතර, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, ආහාර කාණ්ඩයෙහි උද්ධමනය, 2024 නොවැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 0.6හි සිට 2024 දෙසැම්බර් මාසයේ දී සියයට 0.8ක් දක්වා සුළු ඉහළ යෑමක් පෙන්නුම් කළේය.


**කො.පා.මි.ද. (2021=100) මාසික % වෙනස සඳහා දායකත්වය**




මාසික පදනම මත මනිනු ලබන කො. පා. මි. දර්ශකය 2024 දෙසැම්බර් මාසයේ දී සියයට 1.19ක ඉහළ යෑමක් වාර්තා කළේය. මේ සඳහා, ආහාර කාණ්ඩයේ අයිතමවල වාර්තා වූ සියයට 1.24ක මිල ඉහළ යෑමේ සහ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල වාර්තා වූ සියයට 0.06ක මිල පහළ යෑමේ ඒකාබද්ධ බලපෑම හේතු විය. මේ අතර, ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරන, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2024 දෙසැම්බර් මාසයේ දී සියයට 2.7හි නොවෙනස්ව පැවතුනි.

බලශක්ති මිල ගණන් සැලකිය යුතු ලෙස පහළ යෑම සහ නිතර මිල උච්චාවචනය වන ආහාරවල මිල ගණන් පහළ යෑම්වල අඛණ්ඩ බලපෑම් මෙන්ම 2024 මුල් භාගයේදී බදු සංශෝධන නිසා මිල ඉහළ යෑම් මගින් ඇති වූ සැලකිය යුතු පදනම් බලපෑම හේතුවෙන්, මතුපිට උද්ධමනය ඉදිරි මාසවලදී ඍණ අගයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, ඉන් අනතුරුව, උද්ධමනය ධන අගයකට පත්වී, සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, මැදි කාලීනව ඉලක්කගත සියයට 5ක මට්ටමට ක්‍රමයෙන් ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන(අ)**
**කොළඹ පාරිභෝගික මිල දර්ශකය,(ආ) කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %**
**2024 නොවැම්බර් මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව**




90% CI 70% CI 50% CI වාර්තා කරන ලද කාර්තුමය උද්ධමනය(ආ)

● 2024 ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා වාර්තා කරන ලද උද්ධමනය (කො. පා. මි. ද., 2021=100)

▲ 2024 සිව්වන කාර්තුව සඳහා වාර්තා කරන ලද කාර්තුමය උද්ධමනය (කො. පා. මි. ද., 2021=100)

උද්ධමන ව්‍යාප්ති සටහන (Fan chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ.

විශේෂයෙන්ම ආහාර මිල ගණන් හා සම්බන්ධයෙන් වූ, සැපයුම් අවහිරතා උග්‍ර වීමට ඇති හැකියාව; භූ-දේශපාලනික අවිනිශ්චිතතා මධ්‍යයේ ගෝලීය ආහාර සහ බලශක්ති මිල කෙරෙහි ඇති විය හැකි ඉහළ පීඩනය; ඉහළ වැටුප් සඳහා ඇති ඉල්ලුම සාක්ෂාත් වීමට ඇති හැකියාව; ඇති විය හැකි අයහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදනයට සිදුවන බලපෑම; අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාර්ගයෙන් යම් අපගමනයක් සිදු වීමට ඇති හැකියාව; ඉහළ මට්ටම්වලින් රුපියල අවප්‍රමාණය වීමට ඇති හැකියාව; සහ ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රතිපත්ති වෙනස්කම් හේතුවෙන් ගෝලීය උද්ධමනය පහළ යෑම සඳහා ඇතිවිය හැකි අවහිරතා වැනි සාධක මගින් උද්ධමන පුරෝකථන ඉහළ යෑමේ බලපෑම් ඇති කළ හැකිය. මේ අතර, උද්ධමන පුරෝකථන පහළ යෑමේ අවදානම් සැලකූවිට, අනෙකුත් සාධක අතර, අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල සිදු විය හැකි මිල අඩු කිරීම්; සහ මහජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය හීන වීමේ දිගු කාලීන බලපෑම ඇතුළත් වේ.

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන*


(අ) මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහනෙහි දක්වා ඇති පුරෝකථන මගින් 2024 වසරේ නොවැම්බර් මාසයේ පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ.

(ආ) 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ. එම සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථන පදනම් වේ.

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාද[illegible]බන අතර [illegible] නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

CamScanner

## උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය
## (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2023 | දෙසැම්බර් | 195.1 | 172.5 | 0.9 | 0.1 | 4.0 | 0.6 | 17.4 | 14.5 |
| 2024 | ජනවාරි | 200.7 | 176.2 | 2.9 | 2.1 | 6.4 | 2.2 | 14.2 | 11.3 |
| | පෙබරවාරි | 200.6 | 177.2 | 0.0 | 0.6 | 5.9 | 2.8 | 11.3 | 8.5 |
| | මාර්තු | 196.7 | 177.3 | -1.9 | 0.1 | 0.9 | 3.1 | 8.0 | 6.1 |
| | අප්‍රේල් | 195.2 | 177.3 | -0.8 | 0.0 | 1.5 | 3.4 | 5.7 | 4.4 |
| | මැයි | 194.1 | 177.0 | -0.6 | -0.2 | 0.9 | 3.5 | 3.9 | 3.3 |
| | ජූනි | 195.6 | 177.4 | 0.8 | 0.2 | 1.7 | 4.4 | 3.1 | 2.8 |
| | ජූලි | 194.7 | 177.9 | -0.5 | 0.3 | 2.4 | 4.4 | 2.8 | 2.7 |
| | අගෝස්තු | 191.1 | 177.3 | -1.8 | -0.3 | 0.5 | 3.6 | 2.5 | 2.7 |
| | සැප්තැම්බර් | 190.9 | 177.6 | -0.1 | 0.2 | -0.5 | 3.3 | 2.4 | 2.8 |
| | ඔක්තෝබර් | 189.9 | 177.5 | -0.5 | -0.1 | -0.8 | 3.0 | 2.2 | 2.9 |
| | නොවැම්බර් | 189.4 | 177.1 | -0.3 | -0.2 | -2.1 | 2.7 | 1.7 | 3.1 |
| | දෙසැම්බර් | 191.7 | 177.1 | 1.2 | 0.0 | -1.7 | 2.7 | 1.2 | 3.3 |

සටහන: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සහ මාසික වෙනස, වටයන ලද දර්ශකාංක භාවිතා කර ගණනය කර ඇත.

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

CamScanner